# ශ්‍රී ලාංකික චිත්‍රපට සංරක්ෂණය : පසුබිම යථාර්ථය සහ බේදවාචකය පිළිබඳ අධ්‍යයනයක්

සෙනෙවි, හිනිදුම සුනිල්

භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමු විශ්වවිද්‍යාලය, බෙලිහුල්ඔය

## හැඳින්වීම

ශ්‍රී ලාංකික සිනමාව 1925 දී ද ශ්‍රී ලාංකික කතානාද සිනමාව 1947-01-21 දා ද ඇරඹී අතර අද්‍යතනය වන විට වෘත්තාන්ත සිනමා කෘති 1200-1300 අතර ප්‍රමාණයක් බිහිවී ඇත. එසේම 1948 ඇරඹී රජයේ චිත්‍රපට අංශය මඟින් වාර්තා චිත්‍රපට ද සිය ගණනක් නිෂ්පාදනය වී ඇති අතර මේ සියල්ල ශ්‍රී ලාංකික සමාජ ආර්ථික දේශපාලනික හා සංස්කෘතික ක්‍රමවිකාශයේ සහ විපර්යාසයේ මනා ප්‍රතිබිම්බයක් දරා සිටියි. රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයම මේ නිර්මාණ සංරක්ෂණයට මෙන්ම ඒවා ඇසුරින් ජනිත කර්මාන්ත හා ව්‍යාපාරවල ද එකසේ නියුතුව සිටියි. එහෙත් තද්නිර්මාණ සංරක්ෂණයට රාජ්‍ය අංශය පූර්ණ වශයෙන් අසාර්ථකව ඇති අතර පෞද්ගලික අංශය තීව්‍ර ව්‍යාපාරයක නිරත බව අපගේ පර්යේෂණය මඟින් අනාවරණය විය. කිසියම් ප්‍රාමාණික සංරක්ෂණයක නිරත වී සිටින්නේ හේමප්‍රියකණ්ඩම්බි වැනි කේවල සංරක්ෂණකරුවෙකු පමණි.

## පර්යේෂණ ගැටලුව

ශ්‍රී ලාංකික සිනමාවට අයත් සිනමා නිර්මාණ සංරක්ෂණය වී තිබේද?

## අභිමතාර්ථ

- ශ්‍රී ලාංකික චිත්‍රපට සංරක්ෂණය පිළිබඳ මූලික අභියෝගය වටහා ගැනීම.
- දශක හතක පමණ කාලයක් තුළ මෙම කලාකෘති සම්භාරය සුරක්ෂිත කිරීමට රජය අසමත්වූයේ ඇයි ද යන්න වටහා ගැනීම.
- පෞද්ගලික සංරක්ෂණය මුවාවෙන් සිදුවන අක්‍රමිකතා අනාවරණය කර ගැනීම.
- හේමප්‍රිය කණ්ඩම්බි නම් පෞද්ගලික චිත්‍රපට සංරක්ෂකයාගේ කාර්යභාරය වෙත රජයේ සහ ජනතාවගේ අවධානය යොමු කිරීම.

## න්‍යායාත්මක අවධානය සහ ආනුභවික මූලාශ්‍රයන්

ලෝක සිනමාවේ නිශ්ශබ්ද යුගයේ ඇරඹී ශ්‍රී ලාංකික සිනමාව 1947-01-21 දා සිට සිය කතානාද යුගය අරඹයි. එතැන් සිට අද දක්වාම උසස් කලා මාධ්‍යයක් ලෙස දේශීය හා විදේශීය සම්මානයට පාත්‍රව ඇති ලාංකික සිනමාව නොහොත් සිංහල සිනමාව ප්‍රධාන වශයෙන්ම වෘතාන්ත සහ වාර්තා යන ප්‍රවර්ග දෙකින් යුක්ත වේ. වාර්තා චිත්‍රපට මි.මී. 8,16,35 යන මාදිලි තුනෙන්ද වෘත්තාන්ත චිත්‍රපට ප්‍රධාන ලෙස ම මි.මී. 35 මාදිලියෙන්ද නිෂ්පාදනය වී ඇත. කිසියම් වෘත්තාන්තයක්, සිදුවීම් මාලාවක් සහ ප්‍රබන්ධිත හෝ සත්‍යවූ චරිත මාලාවකින් යුතු මෙම කලාමාධ්‍යය සෞන්දර්ය විද්‍යාත්මක අගනාකමට අමතරව ශ්‍රී ලංකාවේ මනුෂ්‍ය දිවිය හාබැඳුණු සකලවිධ සංකීර්ණතාවල සජීවී සාක්ෂ්‍ය සම්භාරය ද වේ. එබැවින් එය සුරැකීම එක් අතකින් ලාංකික ඉතිහාසය සංරක්ෂණය කිරීම ද වේ.

අපගේ පෞද්ගලික නිරීක්ෂණ සහ අධ්‍යයනයන් අනුව යථෝක්ත උරුමය සංරක්ෂණයට රජය අපොහොසත්ව ඇත. 1957 දී Art Magazine වෙත ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් නම් ලාංකික සිනමාවේ සුපතළ නිර්මාණකරුවා මෙම සංරක්ෂණයේ අගය පැහැදිලිකර ඇත. එතැන් සිට එම අවශ්‍යතාව වරින්වර අවධාරණය කර තිබුණ ද අද්‍යතනය වන විට වෘත්තාන්ත චිත්‍රපට 1200-1300 ක ප්‍රමාණයෙන් රජය සතු වන්නේ අතළොස්සකි. රජයේ චිත්‍රපට අංශයේ ඇති වාර්තා චිත්‍රපටවල තත්වයද ඉතාම ව්‍යසනකාරිය.

තිස්ස නාගොඩවිතාන, සුසිල් ධර්මපාල, හේමප්‍රිය කණ්ඩම්බි, ගෝර්ඩන් ද සිල්වා බඳු පෞද්ගලික සංරක්ෂකයන් යථෝක්ත රජය අතහැරී වගකීමට ප්‍රවේශ ව සිටිය ද බහුතරය ඍජුව නිරතව සිටින්නේ වෙළඳාමක පමණි. ඒ පිළිබඳ පර්යේෂකයාගේ විමර්ශන සහ තවත් මූලාශ්‍රයන් සාධක සපයයි. ඇතැම් විට සංරක්ෂණයට මුවා වී සිදු කෙරෙන චිත්‍රපට වෙළඳාම නිසා ජනප්‍රියත්වයෙන් ඉහළට එසවුණු මෙම ඇතැම් ව්‍යාපාරිකයන් අධික තක්සේරුවට මතු නොව ජාතික සම්මානවලට ද පාත්‍රවේ. එහෙත් සත්‍ය ලෙස ම ඔවුහු අවංක සංරක්ෂකයෝ නොවෙති.

හේමප්‍රිය කණ්ඩම්බි නැමැත්තා සතුව මේවන විට සිංහල වෘත්තාන්ත චිත්‍රපට 800 ක පමණ සංචිතයක් ඇත. ඊට අමතරව සිනමාවට සම්බන්ධ උපකරණ, ග්‍රන්ථ, පුවත්පත්, ශබ්දපට, කැමරා, ප්‍රක්ෂේපණ යන්ත්‍ර ඇතුළු මෙවලම් රාශියක කෞතුකාගාරයක් ද පවත්වාගෙනයයි. මේ සියල්ලට ම අවශ්‍ය කාර්මික ඥානය ඔහු සතුය.

ශ්‍රී ලංකාවේ දේශගුණ තත්වය, චිත්‍රපට නිෂ්පාදනය කෙරෙන සෙලියුලොයිඩ් පටයේ තත්වය, ආර්ථික පදනම, කාර්මික ඥානය ආදිය මෙම සංරක්ෂණයට පදනම් වෙයි. ලාංකික චිත්‍රපට සංරක්ෂණයේ ඉතා වැදගත් පරාමිතියක් ලෙස සමාරම්භක පැරණි කෘති මතු නොව අද්‍යතන හෝ සමකාලීන චිත්‍රපට ද ආරක්ෂා වී නොමැතිවීම අපට ප්‍රත්‍යක්ෂ විය. චිත්‍රපට අධ්‍යක්ෂවරු ද සිය නිර්මාණ සංරක්ෂණයට උනන්දු නැත. සියලු දෙනා මි.මී. 35 පටලපටය යල්පැන ගිය කරදරකාරී යමක් ලෙස සලකති. එහෙත් අතීත උරුමයේ සාක්ෂ්‍ය ඒ මත ගැබ් වී තිබීමේ යථාර්ථයෙන් කිසිවකුට මිදිය නොහැකිය. ඩිජිටල් තාක්ෂණ ආගමනය මත ලොවින් සමුගෙන යාමට සූදානම්වන මි.මී. 35 පටලපටය මත නිපදවූ ලාංකික චිත්‍රපට අතීතය ජාතික වස්තුවක් ලෙස සංරක්ෂණය කළයුතු වීම අවිවාදිතය.

## ක්‍රමවේදය

මේ පිළිබඳ ලියවුණු සාහිත්‍ය මූලාශ්‍රයන්, පෞද්ගලික ක්ෂේත්‍ර නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා සහ ශ්‍රව්‍යදෘශ්‍ය මෙන්ම ලිඛිත ද්විතීයික මූලාශ්‍රයන් මත පදනම් වූ ක්‍රමවේදයක් භාවිත කෙරේ.

## ප්‍රධාන අනාවරණ හා සමාලෝචන

- වෘත්තාන්ත හා වාර්තා චිත්‍රපට සංරක්ෂණයට රජය සම්පූර්ණයෙන්ම අසමත් වී ඇත.
- දේශපාලනීකරණය ආයතනික ව්‍යුහය සහ නිලධාරීවාදය එම අසාර්ථකත්වයට බලපා ඇත.
- නිරවද්‍ය සහ කැපවූ සංරක්ෂණ ප්‍රතිපත්තියක් නොමැතිවීම තවත් හේතුවකි.
- මෙමගින් ජනිත අවකාශයක පෞද්ගලික ව්‍යවසායකයෝ රැසක් සිය ව්‍යාපාර මෙහෙයවති.
- චිත්‍රපට සංරක්ෂණයේ නිශ්චිත අදහසක අවංක ලෙස පිහිටා ප්‍රතිඵලදායක සංරක්ෂණයක නිරත වන්නේ හේමප්‍රිය කණ්ඩම්බි බඳු කෙනෙකු පමණි.
- ඉතා කාර්යක්ෂමව, ශේෂව තිබෙන චිත්‍රපට සංචිතය නිසි හා විධිමත් සංරක්ෂණ ව්‍යාපෘතියකට නතු කළ යුතුව ඇත.

## කේන්ද්‍රීය වචන

චිත්‍රපට සංරක්ෂණය, වෘත්තාන්ත සිනමාව, වාර්තා චිත්‍රපට, මි.මී. 35 සෙලියුලොයිඩ්පටලපටය, හේමප්‍රිය කණ්ඩම්බි.

කේන්ද්‍රීය මූලාශ්‍රයෝ

අමරසේන, ආතර්යූ. (2008). සිංහලේ මහා සිනමා වංශය. කොළඹ: බුක්පෝස්ට් ප්‍රකාශකයෝ.

නිහාල්සිංහ, ඩී.බී. (2007). ලාංකික සිනමාවේ ස්වර්ණමය යුගය බිඳවැටීම. (පරි:) එම්. එච්. සෙනෙවිරත්න නුගේගොඩ: සරසවි.

ජිතේන්ද්‍ර, විකුම්. (2012). කණ්ඩම්බිට සවන් දෙන්න. *රාවය,*

සමරවීර, සුදර්ශන. (2014). සිනෙ සිහිනෙක සෙනෙහෙසින් හවකණ්ඩම්බි. *රාවය,*

රත්න විභූෂණ, ඈෂ්ලි. (සංස්) (2012). ප්‍රති බැහැ දැක්ම. කොළඹ: රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.

Wickramage, P.(Ed.) (2000). Lester James Peries Collected works. Colombo: Badraji Foundation.

Wickramasinghe, J., Weeraman, P., & Siriwardhana, R. (1965). The report of the commission of inquiry in to the film industry in Ceylon, Colombo: Government Press.